889

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
03 MAR 2014
UNIVERSITY OF KELANIYA

# ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු සන්නිවේදනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

## ( රත්නපුර දිස්ත්‍රික්කයේ දේවාලයගාව ග්‍රාම සේවා කොට්ඨාසය ඇසුරින්)

ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධය.

ශිෂ්‍ය අංකය:FGS\L\MSSc\2007\16

සමාජීය විද්‍යා පීඨය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

| ප්‍රවේශ අංකය: | 889 |
|---|---|
| වර්ග අංකය: | |

## නිබන්ධන සාරාංශය

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ දේවාලයගාව ග්‍රාමය ඇසුරින් ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු සන්නිවේදනය පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් යන මැයින් සිදුකරන ලද මෙම අධ්‍යයනයේ දී, මැණික් කර්මාන්තය තුළ විධිමත් තොරතුරු සන්නිවේදනයක අවශ්‍යතාව සහ තොරතුරු සන්නිවේදනය ශක්තිමත් කිරීමට අවශ්‍ය පසුබිම හඳුනාගැනීම සිදු විය.

ඒ අනුව මැණික් කර්මාන්තකරුවන්ගේ තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීම, තොරතුරු අවශ්‍යතා ඉටුකිරීම සඳහා අදාළ හඳුනාගත් පරිපාලන ආයතන මඟින් ලබාදෙන දායකත්වය අධ්‍යයනය කිරීම සහ මැණික් කර්මාන්තයේ නියැළී සිටින කර්මාන්තකරුවන් හට තොරතුරු ලබාගැනීමේ දී මුහුණ දීමට සිදුවන ගැටලු යන ප්‍රධාන අරමුණු ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කර ඇත.

ඒ යටතේ පරීක්ෂණයට භාජනය කරන ලද ප්‍රජාව ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත විය. එනම්, රත්නපුර ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ තොරතුරු සම්පාදනයේ දී ඍජුවම දයකත්වයක් දක්වන පරිපාලන නිලධාරීන්ගේ සමස්ත සංගහණය සහ දේවාලයගාව ග්‍රාමයේ මැණික් කර්මාන්තය තම වෘත්තිය කරගත් කර්මාන්තකරුවන්ගේ සමස්ත සංගහණයයි.

එහි දී වැදගත් කරුණක් වශයෙන් පරිපාලන ආයතන සහ මැණික් කර්මාන්තයේ නියැළී සිටින කර්මාන්තකරුවන් අතර තොරතුරු හුවමාරුවේ දී පැහැදිලි පරතරයක් පවත්නා බව අනාවරණය කරගත හැකි විය.

වර්තමානයේ දක්නට ලැබෙන්නා වූ සමාජ, ආර්ථික තත්ත්වයන් හමුවේ මැණික් කර්මාන්තය ආශ්‍රිත දැනුම් පද්ධතිය නවීකරණය වී ඇත. එම තොරතුරු සැපයීමේ දී ආයතනික වශයෙන් කර්මාන්තකරුවන්ගේ තොරතුරු අවශ්‍යතා නිසිලෙස අවබෝධ කරගැනීමකින් තොරව තොරතුරු සේවා සම්පාදනය කර ඇති බැවින් කර්මාන්තකරුවන් අතර සාධාරණ ලෙස තොරතුරු බෙදීයාමට බාධා ඇතිවී තිබේ. ඒ සඳහා තොරතුරු අවශ්‍යතාව මත පදනම් වෙමින් පරිපාලන ආයතන මඟින් සංවිධානාත්මකව තොරතුරු සේවා ප්‍රායෝගික ලෙස යොදගැනීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

දේවාලයගාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මැණික් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු සන්නිවේදනය පිළිබඳ මෙම විස්තරාත්මක අධ්‍යයනයේ දී තොරතුරු සන්නිවේදන පද්ධතියේ සුවිශේෂී තත්වයන් නිරීක්ෂණය කිරීමට හැකි විය. එම නිරීක්ෂණය තුළින් නිගමන රාශියකට එළඹීමට ද හැකි විය. එපමණක් නො ව අවසානයේ තොරතුරු සම්පාදනය කරනු ලබන ආයතන ඒකාබද්ධ වී තොරතුරු ජාලයකින් සන්නද්ධ වී සංවිධානාත්මකව ක්‍රියාත්මක වීම සහ තොරතුරු මධ්‍යස්ථානයක් ඇති කිරීම සඳහා යෝජනා රැසක් ද මෙම අධ්‍යයනයේ දී ඉදිරිපත් කර ඇත.



සෙවුම් පද

- මැණික්
- මැණික් කර්මාන්තය
- සන්නිවේදනය
- තොරතුරු සන්නිවේදනය